**ආයුර්වේද වෛද්‍ය සභාව - 2023**

-------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විෂයය** | **මුදල (රු.)** | **නොසැපයූ විගණන සාක්ෂි** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| දේපල පිරියත හා උපකරණ | 7,116,688 | භෞතික සමීක්ෂණ වාර්තාව | 2024 ජනවාරි 09 දින භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර භෞතික පරීක්ෂණ සිදු කර ඇති අතර මෙතෙක් අවසාන වාර්තාව ලැබී නොමැති බැවින් එය කඩිනමින් ලබාදීමට කටයුතු කරන බව. | දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් භෞතික සමීක්ෂණ වාර්තා කාලීනව විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) **1961 අංක 31 දරන ආයුර්වේද පනත III වන කොටස** | | | |
| **(i)11(1)(ඉ) වගන්තිය** | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔවුන් අතරින් තෝරාපත් කරගනු ලැබූ සාමාජිකයන් තිදෙනෙකු සභාවේ සාමාජිකයන් ලෙස පත්කළ යුතු නමුත් එම සාමාජිකයන් තිදෙනා පත්කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි . | 1963 මාර්තු 15 දිනැති 13564 අංක දරන ගැසට් පත්‍රය අනුව ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ඡන්ද විමසීමක් පැවැත්වීම සිදු කළ යුතු අතර අධික වියදම හා ක්‍රමවේදය කාලානුරූප නොවීම මත එය අපහසු බැවින් 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ අදාළ කොටස් සංශෝධනය කර ගැනීමට 2022 ජුනි 07 දින වෛද්‍ය සභාව විසින් තීරණය කරන ලද බව. | ආයුර්වේද පනතට අනුව කටයුතු කළ යුතු අතර එසේ කටයුතු කළ නොහැකි වන ප්‍රායෝගික දුෂ්කරතා ඉවත් කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)18 (ඇ) හා (ඈ) වගන්ති** | 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිව තිබුණු හෙද නිලධාරින් සංඛ්‍යාව 39ක් හා ඖෂධවේදීන් සංඛ්‍යාව 260ක්වූ අතර ලියාපදිංචිය කාලානුරූපව අලුත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු බැවින් එම සංඛ්‍යා යාවත්කාලීන වී නොතිබුණි. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට සුවිශේෂ වූ හෙද නිලධාරින් බඳවා ගෙන පුහුණු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම වෙනුවට බටහිර වෛද්‍ය ක්‍රමවේද යටතේ පුහුණුව ලැබූ හෙද නිලධාරින් 100ක් ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා බඳවා ගෙන තිබුණද, එමගින් පනතේ අරමුණු අපේක්ෂිත මට්ටමින් ඉටුකර ගැනීමට නොහැකිව් තිබුණි. | බටහිර හෙද පුහුණුව ලබන හෙද නිලධාරීන් ආයුර්වේද රෝහල්වල සේවය සඳහා යොමු කර ඇති නමුත් ඔවුන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම නිසා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ගැනීමට මැලි වන බව. ආයුර්වේද රෝහල්වල සේවයට පැමිණෙන බටහිර හෙද නිලධාරීන් සඳහා මාස තුනක පූර්ණ කාලීන පුහුණුවක් NITM ආයතනයේ ආරම්භ කර ඇති බව. ඖෂධවේදීන් ගේ තොරතුරු යාවත් කාලීන කිරීමට හා ලියාපදිංචි නොවූ අය වෛද්‍ය සභාවේ ලියාපදිංචි කිරීමට අදාළ තොරතුරු රැස් කිරීම සඳහා පළාත් කොමසාරිස්වරුන් හා රෝහල් අධ්‍යක්ෂවරුන් වෙත ලිපියක් යොමු කර ඇති බව. | පනතේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු අතර එසේ කටයුතු කළ නොහැකි වන ප්‍රායෝගික දුෂ්කරතා ඉවත් කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| **(iii) 19(1)(අ) වගන්තිය** | සභාව විසින් එම සභාවේ ලේකම් වශයෙන්ද කාර්ය මණ්ඩලයේ ප්‍රධාන නිලධාරියා වශයෙන්ද කටයුතු කළ යුතු ලේඛකාධිකාරීවරයෙකු පත්කළ යුතු වුවද, එම තනතුරට ස්ථිර පදනමින් ලේඛකාධිකාරිවරයකු පත්කිරීමට කටයුතු නොකර කොන්ත්‍රාත් පදනමට සහ වැඩ බැලීමේ පදනමට දිගින් දිගටම බඳවාගැනීම් සිදුකර තිබුණි. | ආයුර්වේද වෛද්‍ය සභාවේ පූර්ණ කාලීන සේවය සඳහා ලේඛකාධිකාරීවරයෙකු සභාවේ අනුමැතිය මත පත් කර ඇති බව, ලේඛකාධිකාරී බඳවාගැනීම් පටිපාටිය සකස් කිරීමට අදාළ රීති සකස් කොට ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා 2024.02.07 වන දින රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. හා ඒ අනුව ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන බව. | මෙම ක්‍රියාවලිය ඉකුත් වසර ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වන නමුත් මෙතෙක් ප්‍රමාණවත් ප්‍රගතියක් දක්වා නොමැත. ආයුර්වේද පනතට අනුව කඩිනම් පියවර ගත යුතුය. |

**(ආ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ VII වන කොටස**

| | | | |
|---|---|---|---|
| **61 වගන්තිය** | ආයුර්වේද වෛද්‍යාවරයෙකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ අවස්ථාවක ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලේඛකාධිකාරිවරයා විසින් ඒ තැනැත්තා වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු වුවත්, එකී විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන සභාවේ අරමුදල් වැයකර සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සව 04 ක් පවත්වා තිබුණි. | විගණන විමසුමේ පෙන්වා දී ඇති පරිදි 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 61 වගන්තිය ප්‍රකාරව ඉදිරියේ දී ලියාපදිංචි සහතික සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස ලේඛකාධිකාරීට හා අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. එසේම 2022.11.25 දිනැති 08/2022 ජාතික අයවැය චක්‍රලේඛ හා 2022.08.08 දිනැති 04/2022 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන අනුව වියදම් දැඩිව පාලනය කිරීමට කටයුතු කරන බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ලියාපදිංචි සහතික සම්බන්ධයෙන් කටයුතු සිදු කළ යුතුය. |

**(ඇ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත**

| | | | |
|---|---|---|---|
| **(i)38(I)(ඇ) වගන්තිය** | සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එවැනි සමාලෝචනයක් සිදුකර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(I)(ඇ) වගන්තිය ප්‍රකාරව කටයුතු කරන බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | **(ii)38(2) වගන්තිය** | පනතේ 38(I)(ඇ) වගන්තිය ප්‍රකාර සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(2) වගන්තිය , පනතේ 38(I)(ඇ) වගන්තිය ප්‍රකාරව කටයුතු කරන බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | **(i) මුදල් රෙගුලාසි 880 හා 881** | රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටින, චෙක්පත් අත්සන් කරනු ලබන නිලධාරින් එම තනතුරට පත්කළ දින සිට හෝ මාරු කළ දින සිට දෙමසක් ඇතුළත ඇප තැබිය යුතු වුවත්, එකී විධි විධාන ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ නිලධාරීන් 2024 මාර්තු මස ඇප තැන්පත් කිරීමට කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.1** | අවම වශයෙන් වර්ෂ 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි 2024 වර්ෂයේ දී ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කිරීමට කටයුතු කරනු ලබන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුය. |
| (ඊ) | **2014 ඔක්තෝබර් 15 දිනැති අංක 1884/36 අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ආයුර්වේද වෛද්‍ය සභා රීති** | සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05කට වරක් සිය ලියාපදිංචිය අළුත් කරගත යුතු නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 05 ඉක්මවූ වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අළුත් කිරීම සඳහා සභාව විසින් ප්‍රමාණවත් විධිමත් ක්‍රමවේදයක් හඳුනා | ලියාපදිංචිය අලුත් නොකරන අය සක්‍රීය වෘත්තිකයන් ලෙස නොසැලකීමටත් ලියාපදිංචිය සෑම වසර 05 වරක් යාවත් කාලීන කිරීමටත් කටයුතු කරන බව හා එය මුද්‍රිත මාධ්‍ය හා පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් මඟින් දැනුවත් කරන බව. ලියාපදිංචිය අලුත් නොකළ අයගේ නාමලේඛන දිස්ත්‍රික් මට්ටමින් සකස් කර පළාත් | ප්‍රකාශිත ආයුර්වේද වෛද්‍ය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. ලියාපදිංචිය හා ලියාපදිංචිය අලුත් කිරීම දිරිගැන්වීමට සුදුසු ක්‍රමවේද අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දින වන විට වෛද්‍යවරු 13,016ක් සිය ලියාපදිංචිය අළුත් කර ගෙන නොතිබුණි. | ආයුර්වේද කොමසාරිස්වරුන් මඟින් හා ජංගම කාර්යාල පවත්වමින් ලියාපදිංචිය අළුත් කිරීම සඳහා යොමු කර ගැනීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කර ඇති බව හා දේශීය වෛද්‍ය අංශය යටතේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තුවට මෙය ඇතුළත් කිරීමට අමාත්‍යාංශයෙන් ලිඛිතව ඉල්ලා ඇති බව. | |

**1.7 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ එක් එක් මාසය අවසානයේ මුදල් පොතේ ශේෂය රුපියල් මිලියන 7 ත් 12 ත් අතර පැවැති අතර සාමාන්‍ය දෛනික ගනුදෙනු අවශ්‍යතාවය රඳවාගෙන ඉතිරි මුදල් ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | 2024 වර්ෂයේ දී ආයුර්වේද වෛද්‍ය සභාවේ මාසික ආදායම් පිළිබඳ අවධානය යොමු කරමින් ආයෝජන වත්කම් ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ආයතනයේ අනාගත ස්ථාවර පැවැත්ම සඳහා ආයෝජන වත්කම් ගොඩනගා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,758,138 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,266,179 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,491,959 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන හැර මෙහෙයුම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 5,446,551 කින් ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) සභාවේ වැටුප් හා වේතන සඳහා වූ රජයේ ප්‍රදාන හැර, ඉකුත් වර්ෂයේ රු.12,704,691 ක් වූ සභාවේ ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.18,946,083 ක් දක්වා රු. 6,241392 කින් හෙවත් සියයට 49 කින් වර්ධනය වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ රු.16,638,511 ක්වූ සභාවේ මුළු වියදම, සමාලෝචිත වර්ෂයේදී රු.17,533,945 ක් දක්වා රු.895,434 කින් හෙවත් සියයට 5 කින් ඉහළ ගොස් තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සභාවේ මෙහෙයුම් වියදම සියයට 4 කින් ඉහළ යාම ඊට හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ වෘත්තිය විෂමාචාර සම්බන්ධයෙන්ද, ලියාපදිංචි නොවූ ආයුර්වේද වෛද්‍යවරුන් ලෙස පෙනී සිටින තැනැත්තන් සම්බන්ධයෙන්ද 2019, 2020, 2021 සහ 2023 යන වර්ෂවල ලැබී තිබුණු පැමිණිලි 244 කින් පැමිණිලි 37ක විමර්ශන කටයුතු 2023 පෙබරවාරි 22 දින වනවිටත් අවසන් කර නොතිබුණි. | ආයුර්වේද වෛද්‍ය සභාව වෙත ලැබෙන ඇතැම් පැමිණිළි විධිමත් ආකාරයට නොලැබෙන අතර, නිර්නාමික, ලිපිනයක් නොමැතිව හෝ වැරදි ලිපිනයන් සහිතව, ලැබෙන එම පැමිණිළි ඉදිරියට විමර්ශනය කිරීමට ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් සෑම වසරකම ඉතා සුළු ප්‍රමාණයක් ඉතිරි වී ඇති බව. 2019-2022 කාලසීමාවට අදාළව ඉතිරි වී ඇති පැමිණිළි 17ක් සම්බන්ධයෙන් පැමිණිළි කරුවන් විසින් කිසිදු පසු විමසීමක්ද සිදුකර නොමැති බව හා විමර්ශණයට ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් එම පැමිණිලි බහා තැබීමට 2024.02.13 දින වෛද්‍ය සභාව තීරණය කළ බව. | සියලු පැමිණිලි විමර්ශනය කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු අතර පැමිණිලි සම්බන්ධයෙන් පසු විපරම් සිදුකිරීම හා කාලිනව එහි ප්‍රගතිය අගය කිරීම සිදුකළ හැකි වන පරිදි අංගසම්පූර්ණ තොරතුරු පවත්වා ගත යුතුය. පොලිසිය වෙත යොමුකර තිබුණු පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳවද පසු විපරම් කළ යුතුය. |
| (ආ | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 18 (ඇ) හා (ඈ) වගන්තිය යටතේ ආයුර්වේද හෙද හෙදියන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම හා ආයුර්වේද ඖෂධවේදීන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම වෛද්‍ය සභාවේ කාර්යභාරය යටතේ දක්වා ඇති නමුත් එවැනි ලියාපදිංචි තැනැත්තන් පිළිබඳ කිසිදු තොරතුරක් කෙටුම්පත් වාර්ෂික වාර්තාවට ඇතුළත් කර නොතිබුණි. | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 18(ඇ) හා (ඈ) වගන්තිය යටතේ ආයුර්වේද හෙද හෙදියන් හා ඖෂධවේදීන් ලියාපදිංචි කිරීම පිළිබඳ තොරතුරු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කරන ලද බව. | ආයුර්වේද හෙද හෙදියන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම හා ආයුර්වේද ඖෂධවේදීන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම පිළිබඳ තොරතුරු වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දින වන විට වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරු සංඛ්‍යාව 27,205 බවත්, මිය ගිය සංඛ්‍යාව 4,024ක් බවත් වාර්තා කර තිබුණු නමුත් මියගිය පාරම්පරික වෛද්‍යවරුන් පිළිබඳ නිවැරදි තොරතුරු යාවත්කාලිනව ලබා ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද මිය ගිය වෛද්‍යවරුන්ගේ ලියා පදිංචිය අවලංගු කර ඒ බව මහජනතාවට නිවේදනය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් අදාල ලියාපදිංචි සහතික අවභාවිතා කිරීමේ ඉඩකඩක්ද පවතින බව නිරීක්ෂණය විය. | ලියාපදිංචිය අලුත් කිරීම සහ මියගිය වෛද්‍යවරුන් පිළිබඳ තොරතුරු වෛද්‍ය සභාව වෙත වාර්තා කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය යටතේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සහය ලබා ගැනීම සඳහා සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තුවට එම කරුණ ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස අමාත්‍යාංශය වෙත ලිඛිතව දැනුම් දී ඇති බව. | සුදුසු හා නිවැරදි තීරණ ගැනීම සඳහා යාවත්කාලීන හා නිවැරදි සංඛ්‍යා ලේඛන පවත්වා ගත යුතුය. |
| (ආ) | 2014 වර්ෂයේ සිට 2018 දක්වා මුල්වරට ලියාපදිංචි වූ වෛද්‍යවරුන් 1139 දෙනෙකුගේ ලියාපදිංචිය සමාලෝචිත වර්ෂයේ අළුත් කිරීම මගින් රු.1,880,280ක ආදායමක් එකතු කර ගැනීමට ඇස්තමේන්තු කර තිබුණද ඉන් වෛද්‍යවරු 672 කුගේ ලියාපදිංචිය අළුත් කර රු.1,097,280ක ආදායමක් එකතු කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | 2023 වර්ෂයේ අවසාන ගිණුම් වාර්තාව සමඟ ඉදිරිපත් කර ඇති 2015-2018 දක්වා ලියාපදිංචිය ලබා මෙතෙක් ලියාපදිංචිය අලුත් නොකළ වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමේ කටයුතු 2024 වර්ෂය තුලදී අවසන් කිරීමට කටයුතු කරනු ලබන බව හා ඒ අනුව අදාළ ආදායම් උපයා ගැනීමට හැකිවනු ඇති බව. | 2015-2018 දක්වා ලියාපදිංචිය ලබා මෙතෙක් ලියාපදිංචිය අලුත් නොකළ වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අලුත් කර කඩිනමින් හිඟ ආදායම් එකතු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 20 (1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද වෛද්‍ය සභාව නීතිගත සංස්ථාවක් වන බැවින් 1971 අංක 38 දරන මුදල් පනතට අනුකූලව මුදල් පාලනය සිදු කරන නමුත් විධිමත් අධික්ෂණයක් සහිත | ආයුර්වේද වෛද්‍ය සභාවේ ගිණුම් කටයුතු යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා 1997 වර්ෂයේ සිට ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීවරයාගේ සේවය ලබාගෙන ඇති බව. 2018.11.27 වන දින සභාපත්‍රිකා අංක | විධිමත් අධික්ෂණයක් සහිත ගිණුම්කරණ ඒකකයක් ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්කරණ ඒකකයක් ස්ථාපිත කිරීම කෙරෙහි පාලක සභාවේ අවධානය යොමු කර නොතිබුණු අතර සභාවේ ගිණුම් කටයුතු යාවත්කාලිනව පවත්වා ගෙනයාම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ සහාය ලබාගැනීමට කටයුතු කර තිබුණි. | 20/02/05 අනුව ආයුර්වේද වෛද්‍ය සභාව සඳහා වෙනම ගණකාධිකාරී තනතුරක් ඇති කර ගැනීම පිළිබඳ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා සකච්ඡා කලද ගණකාධිකාරී තනතුරක් වෙනම අනුමත කර නොමැති නමුත් ගණකාධිකාරී තනතුරක් අනුමත කර ගැනීම සඳහා ඉදිරි කටයුතු කරන බව. | |
| (ඇ) | සභාවේ නිලධාරියකු නොවන සභාපතිවරයා නමින් අවස්ථා 06කදී රු.292,100 ක අත්තිකාරම් නිකුත් කර තිබුණු අතර එලෙස සභාපතිවරයා සෘජුව සභාවේ මුදල් ගනුදෙනු සඳහා මැදිහත්වීම මතභේදයට තුඩුදෙන කරුණක් වශයෙන් නිරීක්ෂණය කෙරේ. | ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා නිල බලයෙන් ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති ලෙස කටයුතු කරන අතර ආයුර්වේද වෛද්‍ය සභාවේ ගණන්දීමේ නිලධාරියා ද වේ. තවද ආයුර්වේද වෛද්‍ය සභාවේ අත්තිකාරම් ලබා ගත හැකි එකම නිලධරියා ලේඛකාධිකාරීවරයා පමණක් වන බැවින් ලේඛකාධිකාරීවරයා ද අත්තිකාරම් ලබාගෙන ඇති අවස්ථාවක නැවත එම අත්තිකාරම පියවීමට මත්තෙන් තවත් අත්තිකාරමක් අවශ්‍ය වූ විට සභාපතිවරයා නමින් අත්තිකාරම් ලබා ගෙන ඇති බව. | නීති රීති රෙගුලාසි අනුව අත්තිකාරම් ගෙවීම සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2011 ජුනි 30 දින පැවැති 17 වන ආයුර්වේද වෛද්‍ය සභාවේ පළමුවන රැස්වීම් වාර්තාවේ තීරණ අංක 17.19 අනුව පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලිඛිත පරික්ෂණයට අදාල ප්‍රශ්ණ පත්‍ර අලෙවි කර ලැබෙන මුදල් වෛද්‍ය සභා සුභසාධක සංගමයට ලබා දීමට තීරණය කර තිබුණි. ඒ අනුව ප්‍රශ්ණ පත්‍ර විකුණා ලැබෙන මුදල් නිශ්චිත අදායම් ගිණුමකට බැර කර ඉන් එම ආදායම් උත්පාදනය කිරීමට දැරූ වියදම අඩුකර සභාව විසින් තීරණය කරනු ලබන යම් මුදලක් සුභසාධක සංගමයට ගෙවීම සහ එම ගනුදෙනු සභාවේ මූල්‍ය පාලනය හා අධීක්ෂණය යටතේ සිදු කිරීම, නිවැරදි හා විනිවිද පෙනෙන ක්‍රමවේදය අනුව කටයුතු කිරීම වුවද එසේ කටයුතු කර නොතිබුණි. එසේවුවද, සුභ සාධක සංගමය විසින් සභාවේ පරිපාලනයෙන් බැහැරව සභාවේ සේවා අපේක්ෂකයන්ට අවිධිමත් රිසිට්පත් නිකුත් කරමින් සෘජුවම ප්‍රශ්ණ පත්‍ර අලෙවි කර සමාලෝචිත වර්ෂයේ උපයාගෙන තිබුණු රු.211,650 ක් එම සුභසාධක සංගමයේ බැංකු ගිණුමට බැර කර ගෙන තිබුණි. | ප්‍රශ්ණ පත්‍ර කට්ටල අලෙවිය සඳහා සුබ සාධක සංගමය මඟින් බිල්පතක් නිකුත් කරමින් ලබා ගන්නා ලද ආදායම් සංගමයේ ගිණුමට බැර කර ඇති බව. ඉතා සුළු කාර්ය මණ්ඩලයක් සිටින ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලයේ සුභ සාධනය සඳහා ලබා දී ඇති මෙම අනුමැතිය අනුව විනිවිදභාවයෙන් යුතුව මෙම ආදායම් සුභසාධක සංගමය වෙත ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරන බව. | සභාවේ තීරණයට අනුකූලව විනිවිද පෙනෙන ආකාරයෙන් කටයුතු කළ යුතුය. |

## 4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 උපායමාර්ගික සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය අනුව හඳුන්වාදුන් රාජ්‍ය ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2.3 ඡේදය ප්‍රකාරව පිළියෙල කළ යුතු උපායමාර්ගික සැලැස්ම එකි විධිවිධාන ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර අයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2.3 අනුව උපායමාර්ගික සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරන බව. | උපායමාර්ගික සැලැස්ම පිළියෙල කිරීමට රාජ්‍ය ව්‍යාපාර අයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය අනුව හඳුන්වා දුන් රාජ්‍ය ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2.3 ඡේදය ප්‍රකාරව පිළියෙල කළ යුතු වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම තුළ අන්තර්ගත විය යුතු ඉලක්ක, අරමුණු, උපාය මාර්ග, ඇස්තමේන්තු පිරිවැය එකි විධිවිධාන ප්‍රකාරව 2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. තවද ක්‍රියාකාරි සැලැස්මේ කාලරාමුව මාසික පදනමට පිළියෙල කර තිබුණද එහි භෞතික ඉලක්ක ප්‍රතිශතාත්මකව හා මූල්‍ය ඉලක්ක රුපියල් වලින් දක්වා නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර අයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2.3 අනුව පිළියෙල කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛයේ සඳහන් මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව කාර්තු පදනමින් ප්‍රගතිය වාර්තා කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණු අතර ආයුර්වේද වෛද්‍යවරු, පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු, ආයුර්වේද හෙද නිලධාරින් හා හෙසජ්ජකවරු ලියාපදිංචි කිරීම වෙනුවෙන් විභාග පැවැත්වීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම යනාදී වශයෙන් වූ ක්‍රියාවලින්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්ය සාධන දර්ශක පිහිටුවා කාර්යය සාධනය සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය සාධක දර්ශක පිහිටුවීමට අවශ්‍ය කටයුතු සැළසුම් කිරීම පිළිබඳ ආයුර්වේද වෛද්‍ය සභාවේ අවධානය යොමු කළ අතර ඒ අනුව 2022 වර්ෂයේ සිට පාරම්පරික වෛද්‍යවරුන් වශයෙන් ලියාපදිංචිය අපේක්ෂිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් බාරගැනීම මාර්තු 01 සිට ජුනි 30 දක්වාත්, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම ජූලි 01 සිට දෙසැම්බර් 31 දක්වාත් පැවැත්වීමටත් ලිඛිත පරීක්ෂණ පෙබරවාරි හා අගෝස්තු මාසවලදී පැවැත්වීමටත් සැළසුම්කර එය ක්‍රියාකාරි සැළැස්මටද ඇතුළත් කර ඇති බව. | සැලසුම් කළ ක්‍රියාවලින්හි කාර්යයන් ඇගයීමට කාර්ය සාධන දර්ශක පිහිටුවා සමාලෝචනය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටුකල යුතු ක්‍රියාකාරකම් 50කින් ක්‍රියාකාරකම් 14ක් එනම් සියයට 25ක් සමාලෝචිත වර්ෂයේ ඉටු කිරීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාව අවස්ථා තුනකදී සංශෝධනය වීම හා මාස 04 කට ආසන්න කාලයක් 23 වන වෛද්‍ය සභාව පත්නොවීම මත සැළසුම් කරන ලද කාර්යයන් අතුරින් ක්‍රියාකාරකම් සියයට 25ක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හැකිතාක් යථාර්තවාදීව පිළියෙල කළ යුතු අතර එහි ඇතුළත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සම්බන්ධයෙන් වැඩි අවධානයකින් කටයුතු කළ යුතුය. |
| (ඈ) | ක්‍රියාකාරි සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ ආයුර්වේද හෙද නිලධාරින් හා ආයුර්වේද හෙසජ්ජකයන් වශයෙන් තැනැත්තන්ගේ නාම ලියාපදිංචි කිරීමේ භෞතික ප්‍රගතිය සියයට 100ක් බැගින් දක්වා තිබුණු නමුත් 2020 ජුනි 02 දිනෙන් පසුව හෙද නිලධාරින්ද 2019 සැප්තැම්බර් 24 දිනෙන් පසුව ආයුර්වේද හෙසජ්ජකයන්ද ලියාපදිංචි කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හෙද නිලධාරීන් හා හෙසජ්ජකයින් ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සැළසුම් කර තිබුණද අයදුම්පත් ඉදිරිපත් නොවීම මත ලියාපදිංචි කිරීම් සිදු වී නොමැති බව. ඒ අනුව සිදුව ඇති අතපසු වීමක් මත සියයට සියයක ප්‍රගතිය සඳහන්ව ඇති බව හා 2024 නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හැකිතාක් යථාර්තවාදීව නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 4.3 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත 40 වගන්තිය ප්‍රකාරව විගණනය කරනු ලබන අස්ථිත්වයේ පාලක මණ්ඩලය විසින් යථා පරිදි පත් කරනු ලබන අභ්‍යන්තර විගණකවරයකු සිටිය යුතු වුවත් ආයුර්වේද වෛද්‍ය සභාවට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කරගෙන නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය. | ආයුර්වේද වෛද්‍ය සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කරනු ලබන අතර ආයුර්වේද වෛද්‍ය සභාව සඳහා අභ්‍යන්තර විගණක තනතුරක් ඇති කිරීම සම්බන්ධයෙන් ආයුර්වේද වෛද්‍ය සභාවේ අවධානයට යොමු කරන බව. මේ අනුව කටයුතු කිරීම ආරම්භ කරන තෙක් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සකස් කරන විගණන සැළැස්ම තුළ ආයුර්වේද වෛද්‍ය සභාව පිළිබඳ ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | ආයුර්වේද වෛද්‍ය සභාවේ අභ්‍යන්තර විගණය විධිමත් කළ යුතුය |
| (ආ) | සභාවේ මුදල් කටයුතු වලට අදාලව අභ්‍යන්තර විගණන වැඩ සටහනක් පිළියෙල කර ඒ අනුව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන සැලැස්ම තුළ එක් ක්‍රියාකාරකමක් පමණක් විගණනය කිරීමට සැලසුම් කර එක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පමණක් නිකුත් කර තිබුණි. | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සකස් කරන විගණන සැළැස්ම තුළ ආයුර්වේද වෛද්‍ය සභාව පිළිබඳ ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | සභාවේ මුදල් කටයුතු වලට අදාලව අභ්‍යන්තර විගණන වැඩ සටහනක් පිළියෙල කර ඒ අනුව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කළ යුතුය. |

## 4.4 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, චක්‍රලේඛයෙන් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සභාව විසින් සමාලෝචිත වර්ෂයේ කාර්තු 04 සඳහා විගණන කමිටු රැස්වීම් 04ක් පැවැත්විය යුතු වුවද, රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි. | 2024 වර්ෂයේ දී මෙම ගැටලුව නිරාකරණය වන පරිදි 2024 මාර්තු, ජුනි, සැප්තැම්බර් හා දෙසැම්බර් මාසයන් හි විගණන කමිටු රැස්වීම පැවැත්වීමට කටයුතු සැළසුම් කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4.5 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 04ක පුනරාවර්තන වියදම් සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ඉක්මවා තත්‍ය වියදම් දරා තිබුණු අතර එය සියයට 14 සිට සියයට 44 දක්වා වූ පරාසයක විහිදී තිබුණි. තවද මූලධන වත්කම් අත්පත් කර ගැනීමට අදාලව ප්‍රතිපාදන සලසා නොතිබියදී ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලට ගැනීමට රු.23,950ක් වැය කර තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ජා. අ. ච. 05/2022 අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීමට ප්‍රතිපාදන වෙන්කර නොතිබුණද 2022.11.08 දින වෛද්‍ය සභාවේ තීරණය පරිදි භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රතිපාදන ලබා ගත නොහැකි නමුත් ආයුර්වේද වෛද්‍ය සභාවේ ආදායමෙන් සිදු කල හැකි බව තීරණය කළ බැවින් හා වෛද්‍ය සභාවේ දත්ත ආරක්ෂා කර ගැනීමේ අරමුණින් External Hard disk එකක් මිලදී ගැනීම අත්‍යාවශ්‍ය වීම මත රු.23,950 ක් වැය කර අදාළ මිලදී ගැනීම සිදු කළ බව. | අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සේවක ණය අත්තිකාරම් උපරිම වියදම් සීමාව රු.1,200,000ක් ලෙස අනුමත කර තිබුණු නමුත් තත්‍ය සේවක ණය ගෙවීම රු.1,573,000ක් වූයෙන් රු.373,000 කින් ඇස්තමේන්තු සීමාව ඉක්මවා තිබුණි. | 2024 වර්ෂයේ දී අනුමත වියදම් සීමා අනුව කටයුතු කරන බව. තවද අර්ධ වාර්ෂිකව වියදම් ඇස්තමේන්තු පිළිබඳ විශ්ලේෂණයක් සිදු කිරීමට කටයුතු කරන බව. | සේවක ණය අත්තිකාරම් උපරිම වියදම් සීමාව තුළ කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ (ඇ) ඡේදය ප්‍රකාරව තොරතුරු සංනිවේදන තාක්ෂණය භාවිතය, ඩිජිටල්කරණය, මාර්ගගත සේවා සැලසීම ආදී ක්‍රමවේද හඳුන්වා දීම මගින් සභාවේ පුනරාවර්තන හා මෙහෙයුම් වියදම් අවම කිරීම පිළිබඳව උපායමාර්ගයන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම පිළිබඳව කළමණාකරනයේ අවධානය යොමුකර නොතිබුණි. | 2024 වර්ෂයේ දී මේ පිළිබඳ සභාවේ අවධානය යොමු කරමින් කටයුතු කරන බව. | චක්‍රලේඛයේ විධි විධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රභව 06ක ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා තත්‍ය ආදායම් උපයාගෙන තිබුණු අතර එය සියයට (51.67) සිට සියයට 341.75 දක්වා වූ පරාසයක විහිදී තිබීම හේතුවෙන් සභාවේ ආදායම නිසි පරිදි තාත්විකව හා විචක්ෂණශීලිව සමාලෝචනය නොකර ඇස්තමේන්තුගත කර තිබුණු බව නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වූ අයැදුම්පත් සංඛ්‍යාව වැඩි වීම හා ඒ අනුව වාචික පරීක්ෂණ සඳහා යොමු වූ ලිපිගොනු ප්‍රමාණය වැඩි වීම, ලියාපදිංචි වෛද්‍යවරුන් විශාල සංඛ්‍යාවක් විදෙස්ගත වීම සඳහා ඉල්ලුම් කිරීම, රජයේ බැංකු ප්‍රතිපත්ති වෙනස් කිරීම මත ස්ථාවර තැන්පතු ආයෝජන පොලී ප්‍රතිශතය ඉහල දැමීම වැනි හේතු නිසා 2023 ඇස්තමේන්තු ආදායමට වැඩි ආදායමක් උපයා ගැනීමට හැකි වූ බව හා 2024 වර්ෂයේ දී මෙම ආදායම් ඇස්තමේන්තු අර්ධ වාර්ෂිකව නැවත විශ්ලේෂණයක් සිදු කිරීමට කටයුතු කරන බව. | සභාවේ ආදායම නිසි පරිදි තාත්විකව හා විචක්ෂණශීලිව සමාලෝචනය කර ඇස්තමේන්තුගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.6 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසාර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 ''න්‍යාය පත්‍රය'' ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව සභාව තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයුර්වේද වෛද්‍ය සභාව යටතට ගැනෙන කරුණු සම්බන්ධයෙන් ආයුර්වේද වෛද්‍ය සහා සාමාජිකයින් දැනුවත් කොට ඇති බව හා ක්‍රියාත්මක විය යුතු වැඩ සටහන් සකස් කිරීම සඳහා කටයුතු කරන බව. | තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය. |